# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2096/18 - 2018 නොවැම්බර් මස 05 වැනි සඳුදා - 2018.11.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් මා විසින් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නොවන අමාත්‍යවරුන් වශයෙන් පත් කරන ලද අමාත්‍යවරුන් හට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාව ප්‍රකාරව පවරනු ලබන අමාත්‍යාංශයන් ද, එහි විෂයයන් හා කාර්යයන් ද නිශ්චය කර ඇති හෙයින්, 2018 නොවැම්බර් මස 05 වැනි දින සිට මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි එකී අමාත්‍යාංශයන්හි විෂයයන් හා කාර්යයන් ද, එකී අමාත්‍යාංශයන්ට අයත් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන ද පවත්නා බව මවිසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

**මෛත්‍රීපාල සිරිසේන,**
ජනාධිපති.

2018 නොවැම්බර් මස 05 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.


1A - G 27788 — 372 (11/2018)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

**(1) ජාතික සමගිය, සහජීවනය හා මුස්ලිම් ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. ජාතික සමගිය, සහජීවනය හා මුස්ලිම් ආගමික කටයුතු විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මත කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. ශ්‍රී ලංකාවේ අන්‍යෝන්‍යතාවය ප්‍රවර්ධනය සඳහා ජාතික සමගිය හා සහජීවනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සහිතව ප්‍රතිපත්ති සකස් කිරීම
3. කල්පවත්නා සාමයක් ගොඩනැගීමට ජාතික සමගිය හා සහජීවනය සඳහා අවශ්‍යවන්නා වූ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් පිළිබඳ රජයේ බලධාරීන්ට උපදෙස් ලබා දීම
4. සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියේ දී පැනනැගිය හැකි ගැටළු සම්බන්ධයෙන් රජයේ බලධාරීන්ට උපදෙස් ලබා දීම
5. එවැනි ගැටළු සඳහා සුදුසු විසඳුම් සෙවීමට යෝජනා ඉදිරිපත් කිරීමේ දී රජයේ බලධාරීන්ට උපදෙස් දීම
6. සර්ව සහභාගීත්ව සමගි සම්පන්න සමාජයක් ගොඩනැංවීමටත්, සහජීවනය ප්‍රවර්ධනය කරලීම පිණිසත් වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම
7. ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන අදාළ වැඩසටහන් හා ක්‍රියාකාරකම් අධීක්ෂණය හා ඇගයීම
8. විවිධ ප්‍රජාවන් තුළ හා අතර ඇතිවිය හැකි මතබේද හා ගැටුම් සඳහා හේතු පාදක වන කරුණු විසඳීම සඳහා වන ක්‍රියාමාර්ග රජයට යෝජනා කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම
9. ප්‍රජාවන් තුළ හා අතර ගැටුම්කාරී අවස්ථාවන්ට තුඩුදිය හැකි දැඩි

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය (අමාත්‍යාංශයේ මෙහෙවර ක්‍රියාත්මක කිරීමේ ආයතනයකි)
2. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
3. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත (2016 අංක 14)
- මුස්ලිම් පල්ලි සහ මුස්ලිම් පුණ්‍යාධාර භාරයන් හෝ වකුෆ් පනත (1956 අංක 51)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

**උපලේඛනය**

**(1) ජාතික සමගිය හා සහජීවනය සහ මුස්ලිම් ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍ය (සම්බන්ධිතයි)**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| මතබේදකාරී අවස්ථාවන් හඳුනා ගැනීම සහ එවැනි අවස්ථාවන් සමනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සම්පාදනය කිරීම හා නිර්දේශයන් ඉදිරිපත් කිරීම | | |
| 10. ඉහත 1 යටතේ දක්වන ලද ප්‍රතිපත්ති හා අනුගත වෙමින් අධ්‍යාපනික, නීතිමය, දේශපාලනමය, ආර්ථිකමය, සමාජමය හා සංස්කෘතිකමය විෂයයන් අළලා වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම | | |
| 11. ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය මගින් දියත් කරනු ලබන වැඩසටහන් සම්බන්ධයෙන් අදහස් හා සහභාගීත්වය ලබාගැනීම සඳහා, රජය, ව්‍යාපාරික ප්‍රජාව සහ රාජ්‍ය නොවන අංශ සමග සංවාද පවත්වා ගැනීම | | |
| 12. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන පරීක්ෂණ කොමිෂන් සභාවේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වූ විට මැදිහත් වීම | | |
| 13. මූල්‍යමය ආධාර සහ විශේෂඥතාවය ලබා ගනු පිණිස ජාත්‍යන්තර ප්‍රජාව සමග සම්බන්ධතා ගොඩ නැගීම | | |
| 14. යෝග්‍ය ක්‍රමවේද යොදා ගනිමින් අවශ්‍ය වන්නේ නම් උක්ත වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය කර ගැනීම | | |
| 15. 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතට අදාළ සියලුම කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම | | |
| 16. සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම | | |

**උපලේඛනය** (සම්බන්ධිතයි)

**(1) ජාතික සමගිය හා සහජීවනය සහ මුස්ලිම් ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍ය (සම්බන්ධිතයි)**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 17. මුස්ලිම් ආගමික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම | | |
| 18. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනිකුත් සියලුම විෂයයන් | | |
| 19. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**(2) තරුණ, කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය**

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. තරුණ, කාන්තා හා ළමා කටයුතු විෂයයට හා II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මත කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. කාන්තාවන්ගේ ජීවිතයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
3. රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම
4. ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කණ්ඩායම් විශේෂයෙන් අරමුණු කර ගනිමින් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය ඇති කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය
2. කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව
3. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
4. ජාතික ළමාරක්ෂක අධිකාරිය
5. ළමා ලේකම් කාර්යාලය
6. ජාතික තරුණ සේවා සභාව
7. ජාතික යොවුන් සේනාංකය
8. ජාතික යෞවන තිලිණ ප්‍රදාන අධිකාරිය
9. සී/ස. ජාතික තරුණ සේවා සමූපකාරය
10. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත (2005 අංක 34)
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත (1998 අංක 50)
- ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත (1941 අංක 24)
- ළමයින් සහ තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත (1939 අංක 48)
- ජාතික තරුණ සේවා සභා පනත (1979 අංක 69)
- යොවුන් සේනාංක පනත (2002 අංක 21)
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

උපලේඛනය (සම්බන්ධිතයි)

**(2) තරුණ, කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය (සම්බන්ධිතයි)**

| | *I වැනි තීරුව* <br> *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* <br> *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* <br> *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|---|
| 5. | කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම | | |
| 6. | කාන්තා මූලික ගෘහ ඒකක සවිබල ගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම | | |
| 7. | තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීම | | |
| 8. | කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | |
| 9. | ශාරීරික හා මානසික වශයෙන් නීරෝගී දරුවෙකු ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම, පළාත් මට්ටමේ කමිටු සමඟ සම්බන්ධීකරණය, සමායෝජනය සහ පසු විපරම් කිරීම | | |
| 10. | අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම්, ජාතික ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙන සේ උසස් මට්ටමට පමුණුවා, සමාන අවස්ථා සලසාදෙනු පිණිස සැලසුම්, වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම | | |
| 11. | ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | |
| 12. | ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම | | |
| 13. | සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම | | |
| 14. | තරුණ පරපුර නිවැරදි දිශානතියකට යොමු කිරීම අරමුණු කරගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම | | |
| 15. | තරුණ පරපුර කේන්ද්‍ර කරගත් අන්තර්ජාතික සහයෝගිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(2) තරුණ, කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය (සම්බන්ධිතයි)**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 16. රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොටගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 17. තරුණ සංවිධාන සම්බන්ධ කටයුතු | | |
| 18. තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් ස්වෙච්ඡා වැඩසටහන් සම්පාදනය | | |
| 19. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 20. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**(3) ජනමාධ්‍ය හා ඩිජිටල් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. ජනමාධ්‍ය හා ඩිජිටල් යටිතල පහසුකම් විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මත කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව<br>2. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය<br>3. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව<br>4. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව<br>5. ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය<br>6. සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | ■ ඇසෝසියේටඩ් නිවුස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත (1973 අංක 28)<br>■ ලංකා ගුවන් විදුලි සංස්ථා පනත (1966 අංක 37)<br>■ ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනත (1839 අංක 5)<br>■ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 8) |
| 2. ජනතා ආකල්ප යහපත් මානයන් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා දේශපාලනමය ක්ෂේත්‍රයන්හි ප්‍රගමන කාරකයක් ලෙස ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් සම්පාදනය කිරීම | 7. සීමාසහිත ලංකා පුවත් ආයතනය<br>8. සැලසිනේ රූපවාහිනී ආයතනය<br>9. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි- සිනමා උද්‍යානය (රන්මිහිතැන්න)<br>10. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව | ■ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත (1973 අංක 5)<br>■ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත (1982 අංක 6)<br>■ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (2016 අංක 12) |
| 3. ජනතාව තුළ දැනුම, ආකල්ප සහ රසඥතාවයන් ඇති කරලීම උදෙසා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 12. සියලුම තොරතුරු තාක්ෂණ උද්‍යාන<br>13. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය | ■ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත (2003 අංක 27)<br>■ ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත (2006 අංක 19) |
| 4. ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම | | ■ වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 5. උසස් මාධ්‍ය සදාචාරයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |

උපලේඛනය (සම්බන්ධිතයි)

**(3) ජනමාධ්‍ය හා ඩිජිටල් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය (සම්බන්ධිතයි)**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 6. රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 7. ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරීම | | |
| 8. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම | | |
| 9. ප්‍රකාශනවලට අදාළ ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් ක්‍රියාත්මක කිරීම | | |
| 10. දෙපාර්තමේන්තු ප්‍රකාශන හැර රජයේ ප්‍රකාශන අලෙවිය, ගබඩා කිරීම සහ නිකුත් කිරීමේ කටයුතු | | |
| 11. ප්‍රවෘත්ති, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගැනීම | | |
| 12. වාණිජ රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාර සහ විදේශ විකාශයන් ඇතුළු ප්‍රචාරක කටයුතු | | |
| 13. රාජ්‍ය අංශයේ සේවා සැපයීමේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා උචිත තොරතුරු තාක්ෂණ විසඳුම් යොදාගැනීමට සහාය වීම | | |
| 14. පරිගණක සාක්ෂරතාව ඉහළ නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 15. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම දිරිගැන්වීම සඳහා ක්‍රමෝපායන් සැකසීම් | | |
| 16. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 17. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.